චක්‍රලේඛ අංකය: 05/2014/(1)

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/1/2012

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2889488, 2889489

ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491

ඊ මේල් / மின்னஞ்சல் / E-mail info@rgd.gov.lk, rg@rgd.gov.lk

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.

234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.

234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகத் திணைக்களம்
REGISTRAR-GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

වෙබ් අඩවිය / இணையத்தளம் / Web site www.rgdept.lk, www.rgd.gov.lk

16 OCT 2014

දිනය / திகதி / Date: 2014.10.

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්/දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත,

විවාහ,උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන්ට ගෙවන ගාස්තු සංශෝධනය කිරීම

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද මගේ අංක RG/MBD/1/2012 හා 2014.04.02 දිනැති චක්‍රලේඛ අංක: 05/2014 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

එම චක්‍රලේඛයේ 03 වන ඡේදයේ සඳහන් කරුණ විවාහ,උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන්ගේ ඉල්ලීම සලකා බලා පහත සඳහන් ලෙස සංශෝධනය කිරීමට තීරණය කර ඇත.

> 03. විවාහ, උපපැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් විසින් ලියාපදිංචි කරන සෑම ලේඛනයකම දෙවන පිටපත් සහ මාසික වාර්තා ඊළඟ මාසයේ 10 වන දිනය වනවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාර දියයුතු බැවින්, නියමිත දිනට එම ලේඛන තමන් වෙත ගෙන්වා ගැනීමට ඔබ විසින් සෑම ප්‍රයත්නයන්ම දැරිය යුතුය. ප්‍රමාද වී භාර දෙන එක් එක් ලේඛනයක් සඳහාම ප්‍රමාද ගාස්තුව දිනකට රු. 5.00 ක් වශයෙන් සංශෝධනය කර ඇත. එබැවින් රෙජිස්ට්‍රාර්වරුන්ගේ ගාස්තු ඉල්ලීමේ වවුචරපත් නිර්දේශ කර ඉදිරිපත් කිරීමේ දී දෙවන පිටපත් භාර දීමේ ලේඛනය අනුව අදාල ප්‍රමාද ගාස්තු අවකරණය කර ඉදිරිපත් කිරීමට කරුණාකර පියවර ගන්න.

ඉහත ඡේදයේහි සඳහන් සංශෝධනයන් 2014.10.01 වන දින සිට ක්‍රියාත්මක වන අතර, චක්‍රලේඛ අංක: 05/2014 හි අනෙකුත් ඡේදයන් නොවෙනස්ව පවතී.

රෙජිස්ට්‍රාර් ජනරාල්
ඊ. එම්. ගුණසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත්:

1. ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කා. දැ.ගැ.ස
2. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - අ.ක.ස
3. ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රධාන කාර්යාලය - අ.ක.ස
4. කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - අ.ක.ස
5. සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - දැ.ගැ.ස